# සිංහල බෞද්ධයාට කුඩම්මාගේ සැලකිලි

## 2



**මාක්ස්, ලෙනින්වාදී අන්තයෙන්ද, ලිබරල්වාදී අන්තයෙන්ද මිදී, දම්පල් තුමන් ගත් හෙළ බොදු මගට පිවිසි ලොකුසතු හේවා මෙත්තානන්ද හෙවත් එල්.එච්. මෙත්තානන්ද මහාසයාණෝ 1956 පෙබරවාරි 4දා අනඳ විදුහලේදී එළිදැක්වූ බෞද්ධ කමිටු වාර්තාව සඳහා අප්‍රමාණ මෙහෙවරක් කළහ. එසේම, එහි අධ්‍යාපනය සම්බන්ධ කොටසෙහි රචකයාණෝද වෙති. සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මහත් මෙහෙවරක් කළ එතුමාණෝ ක්‍රිස්තියානි මූලධර්මවාදයට හා දෙමළ බෙදුම්වාදයට එරෙහිව පැහැදිලි හඬක් හා වැඩපිළිවෙලක් ගොඩනැගූ ජාතික වීරයෙකි.!**

ක්‍රිස්තියානි සභාවේ ප්‍රතිපත්තිය මෙසේ හෙළි කර තිබේ. ''ඉන්දියාවේ ජාතික ප්‍රබෝධය හා උන්නතිය නිසා යුරෝපයේ ආධිපත්‍යය බිඳවැටේ. මේ විපත වැලැක්විය හැක්කේ එකම ආගමක් ඇතිවීමෙනුයි. මේ අදහසට ක්‍රිස්තියානි ආගම සමඟ තරඟ කළ හැකි වෙන ආගමක් ඇත්තේද? *Page 595 Encyclopdia of Religion and ethices Vol 9.*

එබැවින් ජාතික ප්‍රබෝධයට හා ජාතික උන්නතියට ක්‍රිස්තියානි ආගම පටහැනි වේ. ක්‍රිස්තියානි ආගමට වුවමනා කරන්නේ සුදු මිනිසාගේ අධිරාජ්‍යයයි. මහත්මා ගන්ධිතුමා පවා ක්‍රිස්තියානි ආගම යන්නෙන් පජාතික කිරීම හා සුද්දන් මැවීම හඳුන්වන බව කියා තිබේ. *Young India 11.8.1927*

රටවැසියන් විජාතික කරන මේ ක්‍රිස්තියානි සභාවට අප දරුවන්ගේ අධනපනය කොන්ත්‍රාත් දී තිබීම රටට කරන හතුරු කමකි. මෙසේ අධ්‍යාපනය කොන්ත්‍රාත් දී තිබෙද්දී අපේ ඉංග්‍රිසි දොස්තරවරු පඩි වැඩි නොකොළොත් වැඩ නැවැත්වීමට කරන තර්ජනයට ශෝක වන්නේ ඇයි? ඉඩෝරය නිසා දහස් ගනණ් ජනයා සාගින්නෙන් පෙළෙද්දී අපේ කෝටිපතියන් පැරිසියේ රාත්‍රි සභාජශලා වල වෙරිවීම ගැන ශෝක වන්නේ ඇයි.?

අපේ රට වැසියන් ජාතික ශිෂ්ටාචාරයෙන් පිටමන් කරන්නත් පොදු ජනතාවගෙන් තුරන්කරනනටත් යුරෝපයට ආවඩන කළු සුද්දන් කරන්නටත් දඟලන ක්‍රිස්තියානි සභාවට අපේ දරුවන්ගේ අධ්‍යාපනය කොන්ත්‍රාත් දීම වැනි පාපයක් මිහිපිටනොමැත. අපේ ප්‍රජාතන්ත්‍රවාදය වැනසීමට හා විදේශීන්ට රට පාවාදීමට සැරසෙන කතෝලික සභාවට අපේ දරුවන් භාර දීම වැනි බිහිසුනු අනතුරක් ගැන අපට සිතිය නොහැකිය. පාප් තුම කියන පරිදි කතෝලික සභාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මෙයයි.

''දෙවියන් වහන්සේ විසින්ම කතෝලික සභාව වෙත පමණක් පවරාඇති දිව්‍යමය බලයේ හේතුවෙන් දෙයාකාරයකින්ම සියල්ලටම පළමුව අත්‍යුත්තම ලෙස අධ්‍යාපනය ඒ සභාවට අයිතිවේ. දෙවියන් වහන්සේ කෙරෙම්ම ආ බලයක් බැවින් මේ මිහිපිට ඇති අන්කිසි බලයකට වඩා එය පරම උත්තරීතර එකක් වේ.

මෙහි අවශ්‍ය ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යපනය දීමේ දූත මෙහෙයේ උත්පත්තියෙහි දීද හා එය ක්‍රියාවේ යෙදවීමෙහිදීද මේ මිහිපිට ඇති අන්කිසිම බලවේගයකට යටත් නොවේ. මේ සෛවරීතාව බලපවත්වන්නේ ඇගේ යුක්ති සහගත අභිප්‍රායය හා පරමාර්ථය කෙරෙහි පමණක් නොව ඒ අභිප්‍රාය ඉෂ්ට කරගන්නා උපක්‍රමයන්ද කෙරෙහිය.


තවද සියළුම පොදු හා පුද්ගලික ආයතනයන් හි සිය දරුවන්ගේ ආගමික උගැන්වීම කෙරෙහි පමණක් නොව අධ්‍යාපනයේ අන්හැම අංශයන් කෙරෙහිද ආගම හා සුචරිතය පිළිබඳ වූ හැම නියෝගයන් කෙරෙහිද ආගම හා සුචරිතය පිළිබඳ වූ හැම නියෝගයන් කෙරෙහිද සුපරීක්ෂාකාරීව සිටීම ඇගේ අත්‍යවශ්‍යක යුතුකමක් පමණක් නොව කිසිසේත් අහිමි කළ නොහැකි අයිතිවාසිකමකි.

''සියළුම ජාතින්ට උගන්වව්'' යැයි යන ක්‍රිස්තුස් වහන්සේගේ ආඥාව අනුව කතෝලික සභාව සතු අධ්‍යාපනය දීමේ දූත මෙහෙයට එකම ජාතියක් නොහැර සෑම ජාතියක්ම ඇතුළත් වන්නේය. මේ කාර්යයට විරුද්ධව නිත්‍යානුකූලව නැගී සිටිය හැකි බලයක් මේ මිහිපිට නොමැත්තේය. (*papal Encyclical on the education of youth.*)

මෙයින් අනාවරණය වන ඇත්තක් නම් රෝමානු කතෝලික සභාව කොමියුනිස්ට් වාදය මෙනි. ඔවුන් දෙදෙනාම අනුගාමිකයින්ගෙන් කල්පනා කිරිමේ ශක්තිය බලාපොරොත්තු නොවෙති. ඔවුන් දෙදෙනාටම ඕනෑ පූජකයා හෝ නායකයා කියන දේ ඉස්මුදුනින් භාරගෙන කීකරුවීමයි. ඔවුන්ට ඕනෑ ලෝක ව්‍යාප්ත බලයයි. ඒ දෙකම ප්‍රජාතන්ත්‍රවාදී නොවේ. මෙරට ප්‍රජාතන්ත්‍රවාදය නැති කිරිමට කතෝලික සභාව ක්‍රියාකරන බව දත යුතුයි. ඔවුන් සිංහලෙන් ඉගැන්වීමට විරුද්ධයි. රාජ්‍ය භාෂාවට විරුද්ධයි. රජයේ පාසල් වල බෞද්ධ ළමයින් බුද්ධාගම ඉගෙන ගන්නවාට විරුද්ධයි. නිදහස් අධ්‍යපනයට විරුද්ධයි. එම නිසා ප්‍රජාතන්ත්‍ර ක්‍රමයට බාල පරම්පරාව හැඩගස්සන්නට මොවුන්ට බාරදීම සම්පූර්ණයෙන් වැරදිය. කතෝලික සභාව මෙරට ප්‍රජාතන්ත්‍රවාදය මකා දැමීමට කැතලික් ඇක්ෂන් නම් රහස් ව්‍යාපාරය යොදන බව හැම දෙනාම දැන ගත යුතුය. බුද්ධාගමට හා බුදුහාමුදුරුවන්ට නිගා කිරිම ඉන් එකකි. බුදුහාමුදුරුවන්ගේ ඇස වැසෙන සේ සකස් කරන ලද පින්තූරද, බුදුපිළිමයක් කෙලෙසන අයුරින් ඒ මත කතෝලික පිරිසක් වාඩිවී සිටි ආකාරය දක්වන ඡායාරූපද, ථූපාරාම විහාරයට ඉහළින් කුරුසය විදහාපාන චිත්‍රද ඔබ දැකලා ඇතැයි සිතමි.

ඒ ඇර පහත දැක්වෙන අභ්‍යාස ලිපි රෝමානු කතෝලිකයන් බුද්ධාගමට විරුද්ධව පළකර තිබේ.

**01. "සැරය" නම් කතෝලික පත්‍රයෙන් නිදසුනක්**



**''මේ මිහිඳු පිරිවර ඔවුන් ඔතාගෙන ආ කහ රෙද්ද පැත්තකින් තබා ලංකාවේ රූපත් ගැහැනුන් දැක උන් කෙරෙහි සිත් උපදවා උන් හා රතිසැප වින්ඳාහ.''**

''සංඝමිත්තා නම් ඔහු නැගණියද තම සොහොයුරාට දිරිදීමක් වශයෙන් හා සිංහල පිරිමින්ගේද ලේ දූෂ්‍ය කිරීමටත් තවත් ගැහැණුන් පන්දහසකටත් අධික පිරිවරක් සහිතව ලංකාවට ආවාය. මෙහෙණ සස්නක් අටවාගෙන ඒ ස්ත්‍රිහු ලාංකික පිරිමින්ට දාව දූවරුන් පුතුන් ප්‍රසූත කළහ.''

**02. කතෝලික "නාගසේන" ගේ පොත් 20 පිටුව නිදසුනක් :**

'' බුදුන් වහන්සේගේ විහාරයෙහි එක්තරා මෙහෙණක් කුස දරුගැබක් පිහිටියේය. ................ දරුවා එහිදීම ලැබිණි. මෑත කාලයෙහි මහා කාශ්‍යප නමින් ප්‍රකටව සිටි මහරහතන් වහන්සේ මේ දරුවාය. බුදුන් වහන්සේ හා එක් වැනි රූ ඇතියහ. ............. උන්වහන්සේගේ රූපකාය බුදුන් වහන්සේගේ සමානත්වයට අතිශයින් සදෘශ්‍යයහ.''

කරුණු මෙසේ වුවත් මේවාට පිළිතුරක් වශයෙන් එක්තරා භික්ෂූන් වහන්සේ නමක් විසින් පළකරන ලද '' කන්‍ය මරියාගේ හැටි'' නම් පොත් පිංච ගැන මගේ අප්‍රසාදය ප්‍රකාශ කරන අතර බුද්ධාගමට අසභ්‍ය ලෙස නින්දිත ලෙස අපහාස කරන්නට පළමුවෙන් ඉදිරිපත් වූයේ කතෝලිකයන් බව සිහිකටයුතුයි. ප්‍රතිඵලද වෙනස් වන්නේ හේතුවත් වෙනස් වූ විටය. එනම් බෞද්ධ දරුවන් කතෝලික සභාවට බිලිදීම පළමුව නැවැත්විය යුතුය.

**03. බෞද්ධ දරුවන් විජාතික කිරිම.**

තවද රෝමානු කතෝලික පූජකයින්ගේ සහාය ඇතිව හොරට සිවුරු පොරවාගත් තාපස වෙස් ගත් අවිනීත පිරිසක් මහා සංඝයා වහන්සේට කළ අපහාසය මුළු රටම දන්නවා නොවේද..

රෝමානු කතෝලික පාසලකට යන බෞද්ධ දරුවා අමතා කතෝලික පූජකයා කියන්නේ - ළමයා ඔබගේ පියා ගස්වලට, මැටිවලට, ගඩොල්වලට වඳින්නෙකි. ඔබගේ සංඝයා බත්ගුල්ලෙකි. ලෝකයේ දියුණුවූ අය ක්‍රිස්තු භක්තිකයෝය. බුද්ධාගම අදහන්නේ ගොඩයෝය. බලන්න, කතෝලිකයන්ට ලැබෙන සැප පහසු, වරප්‍රසාද, ඉහළ තනතුරු. නමුත් බෞද්ධයන්ට ලැබෙන්නේ මොනවාද. මෙවැනි කතාවලට උදේ හවස හැමදාම පාහේ බෞද්ධ දරුවා සවන් දෙයි. පාසලේ වටපිටාවද ඒවා සනාථ කරයි. මේ බෞද්ධ දරුවාගේ මොළකැටි මොළයට දුරදිග නොපෙනේ. ඒ සවන්දුන් දෙය ඇත්ත යැයි ඔහු සිතේ තබාගනී. බෞද්ධයෙක්ව ඉපදීම ගැන දුක්වෙයි. තමාගේ දෙමව්පියන් ගැන දක් වෙයි. තමාගේ ගමරට ගැන, තමාගේ ආගම ගැන ඔහු ලැජ්ජා වෙ. තමාගේ සිංහල නම පවා ඔහුට එපා වෙයි. සිංහල නම් අතහැර කතෝලික නම් ගන්නටයි කතෝලික බිෂොප් කෙනෙක් ප්‍රසිද්ධියේම කියා තිබේ. පසුව ඔහුට මෙසේ කල්පනාවක් ඇති වෙයි. කතෝලික පාසල නිසා මට ලැබෙන උසස් තැනට මගේ දෙමව්පියන් මට මදියි. මගේ ගම රට මට මදියි. මගේ ආගම, භාෂාව,පරිසරය මට මදියි. ඒවා මට එපා. මම ඒවායින් හැකි පමණ ඉක්මනින් ඈතවෙමි.

**04. සාත්තු සේවා වෙළදාම**

රජයේ රෝහලේ රෝගාතුරව සිටින බෞද්ධයා ළගට රෝමානු කතෝලික කන්‍ය සොහොයුරියක් ගොසින් මෙසේ කියයි. ඔබ රෝමානු කතෝලික වුවහොත් හොඳ බෙහෙත් දෙනවා. හොඳ ආහාර දෙනවා. ලෙඩේද ඉක්මනින් සුව වෙනවා. බෞද්ධයෙක් නිසා සාත්තුව හරියට නොලැබෙයි. ලෙඩේද සුව කිරිම සැක සහිතයි. බලන්න, කතෝලික ලෙඩුන්ට ලැබෙන ඇප උපස්ථාන, ස්වාමි නිතරම ඇවිත් යාඥා කරනවා, දොස්තර නිතර එනවා. මෙයින් බෞද්ධ ලෙඩාට පෙනියන්නේ තමාගේ ලෙඩේ සුව කරගැනීමට තමාගේ ආගම විකුණනනට සිදුවෙන බවයි. ලෙඩාගේ ආගම වෙනස් කරන සාත්තු සේවය වෙළඳ ජාවාරමක්යැයි මහත්මා ගාන්ධිතුමා පෙන්වා දී තිබේ.

**05. බෞද්ධ දුප්පතුන් මුදලට ගැනිම**

අනාථ වූ,අසරණ වූ, දිළිදු වූ, කොටින් කියතොත් ආර්ථික තත්වයෙන් පහත් වූ අයවුලුන්ට කතෝලික පූජකයා මෙසේ කියයි.

| | | |
|---|---|---|
| මුදල් දෙන්නා | - | කතෝලික වෙයන් |
| ආහාර දෙන්නා | - | කතෝලික වෙයන් |
| රක්ෂාව දෙන්නා | - | කතෝලික වෙයන් |
| ඉඩමක් දෙන්නා | - | කතෝලික වෙයන් |

පරෝපකාරය මගින් කතෝලික ආගමට බෞද්ධ අසරණයින් හරවා ගැනිම මිනිස්කමට නොහොබී. එය අධම ක්‍රියාවකි. එක්තරා බෞද්ධ ගමක දුප්පත් බෞද්ධ ස්ත්‍රියෙකුට කතෝලික වීමේ පොරොන්දුව පිට රුපියල් හයක් කතෝලික පූජකයෙක් දුන්නේය. ඊට තම පවුල භේද භින්න විය.

ලබන කලාපයට